54923

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | |
|---|---|
| සිංහල | I |
| சிங்களம் | I |
| Sinhala | I |

**71 S I**

**2019.08.10 / 0830 - 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
- ✳ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** සහ **(උ)** උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** සහ **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** බුදුහු එදවස් අලුයම් වේලෙහි මහකුලුණු සමවතට සමවැද එයින් නැඟී පෙර බුදු වූ බුදුවරුන්වහන්සේ සමයෙහි මහත් සේ කොට පුරාපී පින්කම් ඇති හේතුසම්පන්න පුද්ගලයන් දක්නා පිණිස බුදුඇසින් ලොව බලනසේක් දසදහසක් සක්වළ නැමැති මහමුහුද වසා නුවණදැල ඇමූසේක. මට්ටකුණ්ඩලී නැමැති කුඩමසු පිළ නැමැති **දියකොල්බඩ** හොත්තේ බුදුන්ගේ නුවණදැලට තමා සම්හ වුවමනා හෙයින් වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳිණ. බුදුහු ඔහු දැක මා එතනට යාමෙන් වන ප්‍රයෝජන කවරේ දෝහෝ යි පරීක්ෂා කරනසේක් 'මා එතනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවාගෙන කොටගත් අනික් පින්කමක් නැතත් සිත පහදවාගත් පමණකින් මියගොසින් තවුතිසා දෙව්ලොව එක්සිය විසිගවුවක් විතර උස ඇති රන්විමනෙක උපදී. ඔහු පිරිවරා දෙවඟනෝ දහසක් දෙන පහළ වෙති.'

(i) බුදුරදුන් මහකුලුණු සමවතට සමවැද එයින් නැඟී ලොව බැලූයේ කුමක් නිසා ද?

(ii) බුදුරදුන්ගේ නුවණ දැලට හසු වූයේ කවරකු ද?

(iii) "වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳිණ" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**දියකොල්බඩ**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ආ)** තව ද මේ අනුරුද්ධකුමාරයෝය, භද්දියකුමාරයෝය, කිම්බිලකුමාරයෝය යන මේ රජකුමරුවෝ තුන්දෙන පසළොස්, සොළොස් හැවිරිදි අවස්ථාවෙහි ඔවුනොවුන් හා සමග කෙළකෙළ හිඳ "බත් උපදනේ කොයින් දැ"යි සැක කළහ. එයින් කිම්බිලකුමාරයෝ එක් දවසෙක කෙළගෙන යන්නාහු **බඩසලින්** වී බානා දැක ඒ සලකුණෙන් "බත් උපදිනේ බඩසලිනැ"යි කීහ. භද්දියකුමාරයෝ දවසෙක සැළියෙන් බත් රන්තලියේ ලන්නා දැක ඒ සලකුණෙන් "බත් උපදිනේ බඩසලින් නොවෙයි; සැළියෙනැ"යි කීහ. අනුරුද්ධකුමාරයෝ කොටුවෙන් වී බානාත් නුදුටුවිරූහ. සැළියෙන් බත් ගන්නාත් නුදුටුවිරූහ. ඉදිරියෙහි කන්නට තබාලූ බත් ම දුටුවිරූහ. එසේ හෙයින් "තොප දෙන්නා ම කියන්නේ නොදැනය; බත් උපදිනා තැන් මම දනිමි; වඩු රියන් උස කැකුළු ඇති මහරන්තලියකින් බත් උපදින්නේය"යි කීහ.

(i) කුමාරවරුන් සැක කළේ කුමක් ගැන ද?

(ii) කිම්බිල කුමාරයා කී පරිදි බත් උපදින්නේ කොතනින් ද?

(iii) "කොටුවෙන් වී බානාත් නුදුටුවිරූහ" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**බඩසල**' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(ඉ) **පංචසිඛය**, තොපි උකුසු වේසයෙන් ආකාශයෙන් ඇවිදුව, මාතලිය, තොපි මත්ස්‍ය වේසයෙන් මා යන ඉදිරියට දියෙන් ගොඩ පැන පියව, මම කට තුබූ මාංශය දමා මත්ස්‍යයා ඩැ ගන්ට යෙමි. පංචසිඛය "තෝ උකුසු වේසයෙන් මා දැමූ මාංශ කැටිය ඩැ ගනුව, මාතලිය තෝ මත්ස්‍ය වේසයෙන් දියට පැන පියව"යි කියා තුන් දෙන අවුත් ඒ ස්ත්‍රිය සමීපයෙහි පෙනී ගියාහ.

කැණහිල් මාංශ කැටියක් ඩැ ගෙන ගඟ සමීපයේ ගොඩ අසල යන කලට මත්ස්‍යයෙක් දියෙන් ගොඩට පැන පීය. කට තුබූ මාංශ දමා මත්ස්‍යයා ඩැ ගන්ට දිවූ කල මත්ස්‍යයා දියට පැන පීය. උකුසු මාංශ කැටිය ඩැ ගත, එකියන සිඟාලයා මත්ස්‍යයාත් නො ලැබ මාංශ කැටියත් නො ලැබ වික්ෂේප ව ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මූණ බල බලා සිටියේ ය. එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනා සී පුවාහ.

(i) මාතලී මවාගත් වේශය කුමක් ද?

(ii) සිඟාලයා වික්ෂේපයට පත් වූයේ ඇයි?

(iii) "මම කට තුබූ මාංශය දමා මත්ස්‍යයා ඩැ ගන්ට යෙමි." මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**පංචසිඛ**' යන වචනයට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඊ) එකල වෙළෙඳාණන්ගේ භාර්‍යාවෝ තුන්වන වාරයෙහි ආ කෙල්ල දැක "එම්බා නැගණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේය යි තොපගේ අමාත්‍යයාණන්ටත් නුගුණ ය; මෝතොමෝ තමාගේ ගෙහිමියා ඉක්ම පවත්නීය යි මටත් නින්දා වන්නේ ය; මෙසේ වරදවා පිළිපැද්දාවුන් අපායෙනුත් නොමිදෙන්නාහු මය"යි කියා මේ ලෝකයෙහි ස්ත්‍රී පුරුෂ යම් කෙනෙක් අනුන් සන්තක භාණ්ඩයෙහි වරදවා පවතිද් ද හෙවත් පුරුෂයෝ පරස්ත්‍රීසේවනය කෙරෙද් ද ස්ත්‍රීජාතීහු පරපුරුෂයන් සේවනය කෙරෙද් ද එසේ අපරාධ කළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම නින්දාත් පැමිණෙයි. දඬදීම් ආදියත් වන්නේය. මෙසේ මෙලොව නොයෙක් **බැසනත්** විඳ පරලොව නරකයෙහි ඉපද සියක් යොදුන් උස ඇති සොළොසාඟුල් දිග කටු ඇති කොළඉඹුල් වෙනෙහි ඉවසිය නොහැකි දුක් විඳිති.

(i) වෙළෙන්දාගේ භාර්යාව කෙල්ල අමතා කළ ප්‍රකාශයෙන් දෝෂ දර්ශනයට ලක් වන්නෝ කවරහු ද?

(ii) අනුන් සන්තක දෙයෙහි වරදවා පැවතීමෙන් මෙලොව දී ලැබෙන විපාක දෙක දක්වන්න.

(iii) "සියක් යොදුන් උස ඇති සොළොසාඟුල් දිග කටු ඇති කොළඉඹුල් වෙනෙහි" මේ උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **බැසනත්** යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ) නැත රිවි රැස් පහ ස  
නොපිපෙන තඹුරු වන ලෙ ස  
ඔහු වෙණ නදින් මි ස  
අනික් නදකින් අපි නොවෙමු තො ස

ගොදුරු ලොබ දුරු ක ර  
ඔහු නිවෙස වට තුරුසි ර  
නොපැහැර **පියපත** ර  
සියොත්හුද ඉඳ අසති වෙණස ර

(i) රිවි රැස් නැති විට නො පිපෙන්නේ කුමක් ද?

(ii) ගොදුරු ලොබ දුරු කළ පක්ෂීන් තුරුසිරට වී වීණා නාදය අසා සිටියේ කෙසේ ද?

(iii) "ඔහු වෙණ නදින් මි ස  
අනික් නදකින් අපි නොවෙමු තො ස"

මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **පියපතර** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

EXAMMOOD.LK
EXAMMOOD.LK

● (ඔ) සහ (ඖ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඔ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මම වන්නා දරුශෝකයෙන් හඬමි. තෙපි කුමක් නිසා හඬා දැ'යි"
(ii) "මොහු නුවරින් පිටත ගෙන ගොස් උක්කාරභූමියෙහි ලා පියව"
(iii) "මාගේ ස්වාමි පුත්‍රයාට පැමිණි මරණ දුක්ඛය තට ද වේව යි"
(iv) "කැනහිල් ධේනුවක් තොමෝ උතුම් වූ සිංහරාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ දැ'යි"
(v) "ඒත් උඹේ පැටියන්ගෙන් බැද්ද ම සුරිකනවා"
(vi) "සතුරන් සහසක් කළ ද පරාජය - තමහට තම සිත වේ පසමිතුරා"
(vii) "ඕනෑම දෙයක් කරන්න පුළුවන්. මට උවමනා රක්ෂාවක් විතරයි."

(ලකුණු 03 × 4 = 12 යි.)

(ඖ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

'දුදනො'ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ,
මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබ ගෙ පාළු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නො දී මකා,
බලා එල්ල
හෙළුව හෙල්ල
මුලැ මැ බෙල්ල
මරු තැනේ,
කතර ගමට රුහුණු රටේ
හිඟා කකා, ලබන විටේ,
පයින් මැ ගොස් ඇවිදැ වටේ,
පොළොවැ උලා නළල් ඇටේ,
දිගට ඇදී
නැඟැ පැහැදී
මහ හඬ දී
"දෙවියනේ,"
රනින් කුකුළු රුවක් පුදමි
රිදියෙන් බිජු වටක් පුදමි
රන් දුනු හී දෙකක් පුදමි
රුවට රිදී රුවක් පුදමි.
"කතර ගමේ
බල මහිමේ
දුටු ද එ මේ?"
හැම තැනේ
කියමින් නම'කුරු ඔබ ගේ,
බොළඳුන් ගෙ ද කිරි තුඩ'ගේ
රඟ දෙන් නට වඩමි අගේ,
එක'තින් හිමි සඳිනි මගේ.
දුදනො'ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ.'
'මට කළ මේ විපත අනේ
බලා-ගන්නැ දෙවියනේ.
වැජැඹෙන නා මෙ විමනේ
බලන්නැ නා සාමිනේ.'

(ලකුණු 12 යි.)

**2.** "පුද්ගල චිත්තාභ්‍යන්තරයේ පවත්නා ගූඪ ස්වරූපය විදහා දැක්වීමත් සාර්ථක අවස්ථා නිරූපණයත් සද්ධර්මරත්නාවලියේ කථාවලට නැවුම් ස්වරූපයක් එක් කරයි" නියමිත කථා වස්තු ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

"ස්ත්‍රී චරිත ස්වභාවයෙහි පවත්නා සංකීර්ණ ලක්ෂණ ප්‍රකට කිරීමත් ඒ සඳහා යෝග්‍ය භාෂා ව්‍යවහාරයක් උපයෝගී කොට ගැනීමත් ඇතැම් ජාතක කථාවල සාර්ථකත්වයට හේතු වී තිබේ." නියමිත කථා වස්තු ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**3.** "අතෘප්තිකර ආශාවන් සපුරා ගැනීමට යාම හේතුවෙන් පුද්ගලයින් පරිහානියට පත් වීම හා එබඳු සිදුවීම් පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය ධර්මෝපදේශ යොදා ගැනීම සද්ධර්මාලංකාරයේ කැපී පෙනෙන ලක්ෂණ වේ." නියමිත කථා ආශ්‍රයෙන් පිරික්සන්න.

**නැතහොත්**

"ළමයින්ගේ චිත්ත ස්වභාවය නිරූපණය කරන ආකාරයත් යහපත් සමාජාශ්‍රය හේතුවෙන් ඔවුන් තම ජීවිත සාර්ථක කර ගන්නා ආකාරයත් පූජාවලියෙහි ඇතැම් කථා මගින් ප්‍රකට කෙරේ." නියමිත කථා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**4.** (අ) විවිධාංගවලින් පෝෂිත පද්‍ය සාහිත්‍යයක් කෝට්ටේ අවධියෙහි දක්නට ලැබේ. එබඳු විවිධාංග **තුනක් වත්** ඇසුරෙන් මේ මතය විමර්ශනය කරන්න. (ලකුණු 07 යි.)

(ආ) "අවස්ථානුකූල ව විවිධ වර්ණනා යොදා ගැනීමත් ඒවා ශබ්දාර්ථ රසයෙන් විචිත්‍රවත් කිරීමත් හේතු කොට ගෙන ගුත්තිල කාව්‍යය පාඨකයාගේ සිත් ගනී." විමර්ශනය කරන්න. (ලකුණු 08 යි.)

**5.** බැද්දේගම නවකතාවේ කේන්ද්‍රීය චරිතය වන සිලිඳු, වනසතුන් හා තම දියණියන් දෙදෙනා සමගත් ගම්වැසියන් සමගත් පැවැත්වූ සබඳතාවල ස්වභාවය නිදසුන් ආශ්‍රයෙන් වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**6.** "කෙටිකතා මාධ්‍යයෙහි සියුම් හා කලාත්මක ලක්ෂණ පිළිබඳ මනා පරිචයත් සමකාලීන ලාංකේය සමාජයෙහි යථා ස්වභාවය ගැඹුරින් ප්‍රතිනිර්මාණයත් නූතන කෙටිකතා රචකයන්ගේ නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණයකි." නියමිත කතා **තුනක් වත්** ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**7.** උපයුක්ත භාෂාව හා වස්තුවිෂය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කොළඹ කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් කවීන් විසින් රචිත ළමා කාව්‍ය නිර්මාණවල දිස් වන විශේෂතා පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**8.** "නාට්‍යෝචිත අවස්ථා මතු කිරීමත් එමගින් සංකීර්ණ මානව චිත්තාවේග නිරූපණය කිරීමත් හේතු කොට ගෙන 'පෙමතො ජායතී සොකො' නාට්‍යය සහෘදයාගේ සිත් දිනා ගනී." විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

54923

AL/2019/71/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

2019.08.15 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ............................

**උපදෙස්:**

- ※ **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල වර්ණ මාලාවෙහි එන 'ඕ' යන්න කුමන අක්ෂරයක් ද?

(1) කණ්ඨ තාලුජ (2) දන්තෞෂ්ඨජ (3) කණ්ඨජ
(4) කණ්ඨෞෂ්ඨජ (5) තාලුජ (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) කන්කලු, වළාකුළු, දෘෂ්ඨිකෝණය, නිර්මාංස, නිස්සබ්ධ
(2) කන්කළු, වළාකුලු, දෘශ්ටිකෝණය, නිර්මාංෂ, නිශ්ශබ්ධ
(3) කන්කලු, වලාකුලු, දෘස්ඨිකෝණය, නිර්මාංග, නිෂ්ශබ්ද
(4) කන්කළු, වලාකුළු, දෘෂ්ටිකෝනය, නිර්මාංස, නිශ්ශබ්ද
(5) කන්කලු, වලාකුළු, දෘෂ්ටිකෝණය, නිර්මාංශ, නිශ්ශබ්ද (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) පතෝල, වම්බටු, නිවිති, තම්පලා (2) කරවිල, පිපිඤ්ඤා, බෝංචි, මැකරල්
(3) වට්ටක්කා, පුහුල්, දඹල, ගොටුකොළ (4) කතුරුමුරුංගා, කොහිල, තුඹ, තිබ්බටු
(5) කොස් ඇට, කංකුන්, කැරට්, මුකුණුවැන්න (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) වචනයක ආරම්භක අක්ෂරය සේ විසර්ගය යෙදේ.
(2) විසර්ගය ස්වරයකට පසු ව පමණක් යෙදේ.
(3) විසර්ගය ලිවීමේ දී 'ඃ' ට පූර්වයෙන් 'අ' යන්න යෙදී තිබීම අනිවාර්ය ය.
(4) විසර්ගය ව්‍යඤ්ජනයකට පසු ව පමණක් යෙදේ.
(5) අනුස්වාරය හා විසර්ගය සැම විට ම වචනයක එක සමීපයෙහි යෙදේ. (......)

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) විදුලිය ආලෝකය, භාණ්ඩ සමීක්ෂණය, සංවාද මණ්ඩපය, සම්මන්ත්‍රණ ශාලාව
(2) අයවැය විවාදය, දේශීය ආර්ථිකය, අවුරුදු උලෙළ, වාසනා මන්දිරය
(3) ප්‍රජා අයිතිය, මූල්‍ය කළමනාකරණය, පාරිභෝගික අධිකාරිය, සංවර්ධන ඉලක්ක
(4) දුම් පරීක්ෂණය, පතාල ලෝකය, උයන් කෙළිය, පරිසර විනාශය
(5) සමාජ අසාධාරණය, මූලධර්ම වාදය, ත්‍රිපිටක අභිවන්දනය, දේශපාලන විචාරකයා (......)

[දෙවැනි පිටුව බලන්න.

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ආභරණ, දෙරණ, උපකරණ, වාරණ
(2) ශාලා, ජාලා, ලූලා, මාලා
(3) නිර්ධන, නිර්ගුණ, නිර්මල, නිර්මාණ
(4) සකල, සුලකළ, විකල, අකාල
(5) සුමධුර, සුධවල, සුසංවර, සුපෙම්බර (......)

1.7. තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සසර, මිතුර, කතර, උත්තර
(2) පියන, රියන, නයන, වියන
(3) පුත්, නෙත්, පත්, ගත්
(4) මව, නැව, භව, පව
(5) සුදු, බුදු, මෘදු, කුදු (......)

1.8. 'යව්, කු, ප, න' යන වර්ගයන්ට අයත් අව්‍යය සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සුසැදි, කුමන්ත්‍රණ, අනියම්, අනුමෝදනා
(2) අනියම්, කුමන්ත්‍රණ, සුසැදි, අනුමෝදනා
(3) අනුමෝදනා, සුසැදි, අනියම්, කුමන්ත්‍රණ
(4) සුසැදි, අනුමෝදනා, කුමන්ත්‍රණ, අනියම්
(5) අනුමෝදනා, කුමන්ත්‍රණ, සුසැදි, අනියම් (......)

1.9. කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සරන, දරණ, කරන, වරන
(2) සිතු, ගෙතු, පැතු, එතු
(3) සැරෙන, පැරෙන, තේරෙන, වැමැරෙන
(4) බාදන, වාදන, ඡේදන, වේදන
(5) පැළිලි, බැලිලි, හැළිලි, දිලිලි (......)

1.10. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**දමාලා** යන නරක කුණු කය ..."
(ආ) "**වයව** තත් සිඳ සිඳ"
(ඉ) "එදා සහසකර පහනෙව් **කරත** හෙළි"
(ඊ) "අව්වේ තියෙන රැස්මාලා අඩු **වේවා**!"
(1) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(3) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
(4) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා
(5) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා (......)

1.11. තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) දාරුමය, රජතමය, පිළිමය, වජ්‍රමය
(2) අද්‍යතන, නූතන, සදාතන, මධ්‍යතන
(3) මාධුර්ය, සාමර්ථ්‍ය, ධෛර්ය, සාකල්‍ය
(4) ගුණවත්, ධනවත්, බලවත්, නැණවත්
(5) මිත්තණි, දියණි, මෑණි, නැන්දණි (......)

1.12. උපසර්ගයක් **යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) දුෂ්කර, දුශ්ශීල, දුෂ්පෝෂණ, දුස්සාධ්‍ය
(2) නිදොස්, නිවහල්, නිතරග, නිකැලැල්
(3) පබල, පමොද, පබඳ, පබොද
(4) නිරවශේෂ, නිරාගමික, නිරාමිෂ, නිරපේක්ෂ
(5) සුලලිත, සුරිඳු, සුමිතුරු, සුචරිත (......)

1.13. නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අන්න, මෙන්න, අතන, මෙතන
(2) කල්හි, සඳ, පටන්, තෙක්
(3) සඳහා, වෙනුවෙන්, පිණිස, විනිස
(4) සේ, එව්, බඳු, වැනි
(5) හෙවත්, නොහොත්, වනාහි, චූකලි (......)

1.14. "මගී ජනතාවගේ **ගමනාගමන** කටයුතු **ප්‍රවර්ධනයට** නිලධාරීහු **විධිමත්** පියවර ගනිති" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, උපසර්ග හා තද්ධිත
(2) උපසර්ග, සන්ධි හා තද්ධිත
(3) සන්ධි, තද්ධිත හා උපසර්ග
(4) තද්ධිත, උපසර්ග හා සන්ධි
(5) උපසර්ග, තද්ධිත හා සන්ධි (......)

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) සැරසුවා ය, මතුළා ය, වැනසුවේ ය, ඇඹරුවා ය
(2) නටද්දී, කියද්දී, මුමුණද්දී, දැමුවොත්
(3) සරසනුව, ලියනුව, පමුණුව, තබනුව
(4) තළවයි, සාදවයි, බලවයි, පාගවයි
(5) කළේ ය, බැලුවේ ය, ඇම්මා ය, දුන්නේ ය (......)

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

1.16. සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අහසපොළොව, ධනධාන්‍ය, වැව්මුහුද, පිඟන්කෝප්ප
(2) අනුචිත, අනාගත, අනපේක්ෂිත, අනුල්ලංඝනීය
(3) විනිසකරු, ගොපල්ලා, කම්කරු, අතවැසි
(4) දුදන, දුසිරිත්, දුබල, දුලබ
(5) ඇත්ගාල, රජඅණ, ළමාලොව, සර්පවිෂ (......)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) පොල්ලත්ත, පත්තිරු, ගොක්කොළ, තිල්ලහස
(2) විවේකාගාරය, ජලාපවහන, රූපකාලංකාරය, ජාතිකෝත්සවය
(3) පුරඟන, නරඟන, දෙවඟන, ගවඟන
(4) නරනිඳු, බමරිඳු, කෙසරිඳු, තෙරිඳු
(5) දැස, දැවර, දැළ, දැඟිලි (......)

1.18. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?

(1) පෙම්ගඟුල, හදවිමන, කිතුගොස, සෝගින්න
(2) පූජෝත්සව, මහෝපාධ්‍යාය, අවස්ථෝචිත, මහෝත්තම
(3) අධිකතර, පාපතර, යෝග්‍යතර, ජ්‍යෙෂ්ඨතර
(4) නියත, කියත, විරිත, සිරිත
(5) පෑ, දෑ, නෑ, කෑ (......)

1.19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) කෝයස් නොහොත් සාගර පලන්සූරිය සුදෝසුදු කාව්‍යය රචනා කළේ ය.
(2) රාජ්‍ය නායකයන් රටක ආදර්ශවත් ව හැසිරිය යුත්තාහ.
(3) විශ්වවිද්‍යාලය ශිෂ්‍යයෝ බොහෝ විට විශ්වවිද්‍යාලයේ නැත.
(4) මානව හිමිකම් සම්බන්ධ නීතීහු කලින් කල වෙනස් වෙයි.
(5) ජනාධිපතිතුමා විසින් විද්වතකු රාජ්‍ය සම්මානයෙන් පුදන ලදී. (......)

1.20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) දැන් ඒ ගොල්ලො සමාගමේ ලොක්කො වෙලා ද?
(2) අනුන්ට දොස් නො කියා තම රාජකාරිය ඉටු කිරීම මැනවි.
(3) දඹුල්ල පැත්තේ මං පහරන්නො කට්ටියක් ඉන්නව ලු.
(4) ඒ ළමයා උදේ හිටන් අව්වෙ වැඩ කොරන්නෙ.
(5) කිච්චත් වාලෙ උන්දැ ගෙදරට ම ඇවිල්ල නොවැ. (......)

(ලකුණු 20 යි.)

❊ ❊



EXAMMOOD.LK EXAMMOOD.LK

EXAMMOOD.LK
EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදි සාධකවල ඍජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත් මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

(i) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ ලේඛකයා හඳුන්වන්නේ කවර නමකින් ද?

(ii) වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අතීතයේ පැවති ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් ව ඇත්තේ කවර කරුණු හේතුවෙන් ද?

(iii) වියපත් වූවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් කිරීම උදෙසා ලේඛකයා යෝජනා කරන්නේ කුමක් ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට සම්පාදනය විය යුතු අවශ්‍යතා මොනවා ද?

(v) වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධාව වශයෙන් සමාජ පර්යේෂකයන් දක්වන්නේ කුමක් ද?

(vi) මෙහි දැක්වෙන පරිදි ලෝකයේ බොහෝ රටවල් හා ශ්‍රී ලංකාව මුහුණ පාන්නේ කෙබඳු සමාජ අර්බුදයකට ද?

(ලකුණු 12 යි.)

[පස්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ ස්වශක්තිය, සහභාගිත්වය එක්වී බිහි වන නිර්මාණශීලී නව උත්පාදන ශක්තිය තුළිනි. එහෙයින් ම මෙම සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය අතිශයින් ම ගැඹුරු වනු පෙනේ. එමෙන් ම අර්ථවත් වනු දිසේ. අනෙක් අතට ජනතා පදනමක් ද එහිලා පැනේ. එමතු ද නොව පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්ප සංවර්ධන ක්‍රියාවලියක් ද වනු ඇත. සහභාගිත්ව සංවර්ධනය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයක් නම් නො වේ. සාම්ප්‍රදායික සංවර්ධනයේ දී දිළිඳු ජනතාවගේ නිර්මාණ ශක්තිය මතු වීමට පෙරාතුව ම බාහිර ආධාර ඉස්මතු වෙයි. ඒ සමග ම නැඟී එන අංකුර නවෝත්පාදන දහරා වියැකී යයි. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී බාහිර ආධාරයන් මත නොව ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය බවට පත් වෙයි. බාහිර ආධාර සහ සහනාධාර මත පදනම් වූ වැඩසටහන් එම ආධාර ලැබීම් නැවැතීමත් සමග ම ඇණ හිටී. නැතහොත් අතුරුදහන් වනු ඇත. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නිර්මාණාත්මක නවෝත්පාදන ශක්තිය ඒ වන විට වර්ධනය වී සියත් බව තුළ සහභාගිත්වයේ ම රුඳෙන බැවිනි. (ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන අරගල, මැතිවරණ සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

(ii) ගෝලීය ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට ලෝක බලවතුන් මැදිහත් වීමේ අවශ්‍යතාව

(iii) භාෂාව, සාහිත්‍යය මෙන් ම ඉතිහාසය ද හැදෑරීමට පාසල් ශිෂ්‍යයන් යොමු කරවීමේ කාලෝචිත බව

(iv) ජයග්‍රහණය ම නො ව කායික - මානසික සෞඛ්‍ය වර්ධනය ද ක්‍රීඩාවේ පරමාර්ථවලින් එකකි.

(v) මෙරට පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ යෝග්‍යතාව

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයන් ඇත.
(ii) අනාථ නිවාස පාලිකාව ඔහු දරුවෙක් මෙන් ඇති දැඩි කළා ය.
(iii) අපි වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.
(iv) 'වීරාභිවන්දන' උලෙළේ දී ඇමතිතුමා විසින් ජාතික වීරයෝ ඇගයෙති.
(v) තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීන් වෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ජනාධිපති විදේශ නියෝජිතවරියක පිළිගත්තේ ය.
(ii) සමාජ සේවකයෙක් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙයි.
(iii) ඔවුහු අධිකරණ නීති-රීතීන් උල්ලංඝනය කරති.
(iv) කවුරු මේ විශාල වෘක්ෂයන් කපා බිම හෙළත් ද?
(v) කුමරතුඟු මුනිදස්හු 'ව්‍යාකරණ විවරණය' ලියූහ.

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (කෘමීන්/කෘමීහු) කුඹුර විනාශ කරති'යි (ගොවියෙක්/ගොවියකු) දුකින් පසු වෙයි.
(ii) (නිළියක්/නිළියක) වේදිකාවේ නටනවා (ප්‍රේක්ෂකයෝ/ප්‍රේක්ෂකයන්) බලා සිටිති.
(iii) ලංකාවේ රාජ්‍ය නායකයා (හෙවත්/නොහොත්) ජනාධිපතිතුමා ඒ සමුළුවට සහභාගි (වූයේ ය/වූහ).
(iv) (නිවේදකයකු/නිවේදකයෙක්) විසින් ආරාධිත (අමුත්තන්/අමුත්තෝ) පිළිගන්නා ලදහ.
(v) (මැරයන්/මැරයෝ) සාමාන්‍ය ජනතාව බිය ගන්වද්දී වගකිව (යුත්තෝ/යුත්තන්) නිහඬ ව සිටිති.

(ලකුණු 05 × 3 =15 යි.)

[හයවැනි පිටුව බලන්න.

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **සඳහිරු** පවත්නා **තුරු** මේ වටිනා වස්තුහු අන්සතු නො **වෙත්වා**! (**සඳහිරු** - සමාස, **තුරු** - නිපාත, **වෙත්වා** - ක්‍රියා)

(ii) **පුරාංගනාවෝ** නුවනත මෙන් ම **වරලස** ද **සුවඳ** ජලයෙන් සේදූහ. (**පුරාංගනා** - සන්ධි, **වරලස** - තද්ධිත, **සුවඳ** - උපසර්ග)

(iii) ජාතික ගීය **ගයද්දී** සියල්ලෝ **ම අසුන්වලින්** නැගී සිටියහ. (**ගයද්දී**-ක්‍රියා, **ම** - නිපාත, **අසුන්වලින්** - විභක්ති)

(iv) **පෙම්වතා** තම ප්‍රියාවගේ **දැත** තරයේ ගෙන සවනතට ආදර ගීයක් **මුමුණමින්** ප්‍රීති වූයේ ය. (**පෙම්වතා** - තද්ධිත, **දැත** - සන්ධි, **මුමුණමින්** - ක්‍රියා)

(v) **සුළඟින් සෙලවුණු** තුරුපත් පෙළ සෙමින් එළිමහන් **රංගභූමියෙහි** පතිත විය. (**සුළඟින්** - විභක්ති, **සෙලවුණු**- කෘදන්ත, **රංගභූමියෙහි** - විභක්ති)

(ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මෙවර රාජ්‍ය සාහිත්‍ය ...................... උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

(ii) වසන්ත කාලයෙහි ඇසෙන කෝකිල ...................... සැමගේ කන් පිනවයි.

(iii) ගල්ලෙන්වල ඇති ...................... බිතුසිතුවම් සංරක්ෂණය කළ යුතු ය.

(iv) අපේ ගමෙහි සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ගෙන් යුතු අලුත් අවුරුදු ...................... පැවැත්විණි.

(v) මනාල යුවළ පෝරුවට නඟින විට බාලිකාවෝ ජය මඟුල් ...................... ගැයූහ.

(vi) සමහර ...................... ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ වර්තමානයේ ද ඇගයීමට ලක් වේ.

(පුරාණ, උලෙළ, ගීත, උත්සවය, පැරණි, ගී) (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) හත් + අඩිය
(ii) දෙ + අඟුල්
(iii) කථා + උපකථන
(iv) ශාලා + අධිපති
(v) පස් + සාළිස්
(vi) පුන + උත්ථාපන

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) ගවේෂකයා **රටින් රටට** යමින් තොරතුරු එක් රැස් කළේ ය.

(ii) **සිංහලයනි**, නැඟිටිවු. **බුද්ධගයාව** බේරා ගනිවු!

(iii) **තම** භාණ්ඩාගාරය තර කිරීම **ධනවතාගේ** ඒකායන පරමාර්ථය විය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) මහත්මයාණනි මහත්මියනි, පෙව 9.00ට රැස්වීම ඇරඹෙන බව දැනුම් දෙමි.

(ii) 'අනේ මගේ පුත්‍රයා කොහි ද' යනුවෙන් ඈ විලාප නැඟුවා ය.

(iii) ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නුදුටි මොක්පුර
යන කවිය ඔහු සිහින් ස්වරයෙන් මිමිණුවේ ය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම මගේ කාර්යය නීත්‍යනුකූල ව ඉටු කරමි"යි ලේකම් නිවේදනය කළේ ය.

(ii) ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට "නුඹ නුඹගේ වගකීම ඉටු කරනු"යි විනිශ්චයකාරයා අණ කළේ ය.

(iii) "අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අද පටන් බලාත්මක කරනවා"යි මන්ත්‍රීවරු එක හඬින් කියා සිටියහ.

(ලකුණු 01 × 3 = 03 යි.)



EXAMMOOD.LK EXAMMOOD.LK

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කාශ්‍යපයෝ** සූර්යයා **අස්තංගත** වන සන්ධ්‍යා යාමයේ සීගිරි පර්වතයේ අවරදිග පාර්ශ්වයෙහි ගල්තලාවක් මත අසුන් ගෙන සිටියහ. තම සහෝදරයා ජම්බු ද්වීපයෙන් මහා සේනාවක් ගෙන තමාට හිමි රාජ්‍යත්වය ලබා ගැනීම පිණිස මේ භූමිය **ආක්‍රමණය** කිරීමට පැමිණෙමින් සිටින බව චරපුරුෂයන් ඔහුට දැනුම් දී තිබිණ. සැබවින් ම මේ ස්වභාවාලංකාරයෙන් රමණීය පර්වත බලකොටුව යුද්ධමය වශයෙන් වැදගත් යැයි ඔහු කිසි විටෙක නො සිතුවේ ය. මෙය සතර අතින් වට කළොත් සියලු සැපයුම් මාර්ග අවහිර වනු ඇත. එවිට සුරතින් කඩුව ගෙන ගෙල සිඳ ගැනීම හැර වෙනත් විකල්පයක් නොමැත. තම ජීවිතය විනාශ වූයේ නමුදු මේ **ආහ්ලාදජනක** රම්‍ය කලා නිකේතනය, **මනෝරඤ්ජනීය** වූ සිත්තම් පෙළ වැනසෙනු දැකීමට ඔහු ඉඩ නො දෙන්නේ ම ය. එසේ ම තම අන්තඃපුරයේ සිටින **සුරවමියන්** බඳු **පුරවමියන්** මිය යනු දැකීම ද කෙසේ වත් ඉවසිය නො හැකි ය. එබැවින් කාශ්‍යප පර්වතයෙන් බැස යුද පෙරමුණ වෙත ගමන් කරනුයේ අතරමඟ දී සිය දිවි හානි කර ගත්තේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) සීගිරි, සිතුවේ ය, දැකීම යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. රකාරාංශයක් හා මූර්ධජ අක්ෂරයක් සහිත වචනයක්
2. නාසික්‍යාක්ෂර තුනක් අන්තර්ගත වචනයක්
3. ඝෝෂ තාලුජ ව්‍යඤ්ජනාක්ෂරයක් හා යංශය සහිත වචනයක්

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
ස්වභාවාලංකාර, සුරතින්, සිත්තම්

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.
මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත බහු වචනයක්), අසම්භාව්‍යක්‍රියා

(ලකුණු 03 × 5 =15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) පූර්වස්වර ලෝප සන්ධිය

(ii) පූර්වක්‍රියා

(iii) විශේෂණ සමාසය

(iv) අනම්‍යකරණය

(v) කණ්ඨජ අක්ෂර

(ලකුණු 05 × 3 =15 යි.)

* * *